චක්‍රලේඛ අංක -11/2016

මගේ අංකය : කේ05/5/විවිධ/11/2016
බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 09.
2016-02-03 වන දින.

සියළුම බන්ධනාගාර අධිකාරීන් සහ
සහකාර බන්ධනාගාර අධිකාරී වෙත .

අසාධ්‍ය තත්ත්වයේ පසුවන ඥාතීන් බැලීම සඳහා රැඳවියන් රැගෙන යාම පිළිබඳ ඉල්ලීම්.

අසාධ්‍ය තත්ත්වයේ සිටින ඥාතීන් බැලීමට රැඳවියන් රැගෙන යාම සිදු කිරීමෙන් පසු යළි මාස 06 කට පසු එම අසාධ්‍ය ඥාතියා බැලීමට යාම සඳහා ඉල්ලීම් නිර්දේශ කර ඉදිරිපත් කිරීම බහුල වශයෙන් සිදුවන බව පෙනී ගොස් ඇත. එබැවින් පහත දක්වා ඇති පැහැදිලි කිරීම් හා උපදෙස් අනුව කටයුතු කිරීමට බන්ධනාගාර ආයතන භාර අධිකාරීවරුන් සහ සහකාර අධිකාරීවරුන් විසින් පියවර ගත යුතුය.

2. මාස 06 ක කාලසීමාවෙන් අදහස් වනුයේ ඉතා අසාධ්‍ය තත්ත්වයේ පසුවන ඥාතියෙක් බැලීමට රැගෙන යාමෙන් පසු මාස 06 ක කාලයක් තුළ එම ඥාතියා මිය ගිය හොත් මෘතදේහයට අවසන් ගෞරව දැක්වීමට රැඳවියා හට අවකාශ නොදෙන බවට රැඳවියා දැනුවත් කර එකඟතාවය ලබා ගත යුතු බවය.

3. ඉතා අසාධ්‍යව සිටිය දී අසාධ්‍ය රෝගියා සිටින ස්ථානයට ගෙන යාමේ අවස්ථාව අතිශය මානුෂික පදනම මත සළකා දැඩි වගකීමක් දරමින් සිදු කරන ක්‍රියාවක් වන අතර, එය එකම රෝගියා සඳහා මාස 06 න් 06 ට ලැබෙන වරප්‍රසාදයක් වශයෙන් සැලකිය යුතු නොවන බැවින් මෙම එක් අයකුට එක් වරක් පමණ විය යුතුය .

4. රෝගී තත්ත්වය මත රැඳවියන් ගෙන යාමේ දී ඥාතීත්වය වශයෙන් දෙමවුපියන්, දරුවන්, සහෝදර සහෝදරියන් සහ බිරිඳ/ස්වාමිපුරුෂයා සැලකිය යුතුය .

5. එබැවින් ඉතා අසාධ්‍ය බව සහ ඥාතීත්වය සම්බන්ධයෙන්, රෝගියා රෝහලක සිටින අවස්ථාවක ආසන්න බන්ධනාගාරයේ පුනරුත්ථාපන නිලධාරියෙකුගේ නිරීක්ෂණ වාර්තාවක් ද, රෝහලක නොවන අවස්ථාවක අදාල පොලිස් ස්ථානයේ වාර්තාව මගින් ද, පුනරුත්ථාපන නිලධාරී ක්ෂේත්‍ර වාර්තාවක් මගින් ද තහවුරුවක් ලබා ගෙන සෑහීමට පත්වන්නේ නම් පමණක් සිය නිර්දේශ අනුමැතිය පිණිස ඉදිරිපත් කළ යුතුය.

6. රැඳවියන් එවැනි අවස්ථා සඳහා බැහැරට ගෙන යාමේ දී ප්‍රවාහනය සම්බන්ධයෙන් අංක කේ2/52 හා 1958-01-07 දිනැති බන්ධනාගාර කොමසාරිස් ජනරාල් චක්‍රලේඛය මගින් ලබා දී ඇති උපදෙස් එවකට, එනම් දැනට දශක 05 කට පෙර පැවති බන්ධනාගාර හා සමාජයීය තත්ත්වයන්ට අනුරූප වන පරිද්දෙනි. එබැවින් වර්තමානයේ බලාත්මක සෙසු නීති රීති හා ආරක්ෂක විධිවිධාන සුරැකෙන පරිදි මින් ඉදිරියට එවැනි අවස්ථා සඳහා බැහැරට ගෙන යාම බන්ධනාගාර වාහනයක් මගින් පමණක් නිසි ආරක්ෂක විධිවිධාන යටතේ සිදු කිරීමට වගබලා ගත යුතුය.

7. අවසන් ගෞරව දැක්වීම සඳහා ගෙන යාම මෘත දේහය තබා ඇති ස්ථානය මිස ආදාහනය/ භූමිදානය සිදු කරන ස්ථානය නොවිය යුතු අතර ප්‍රමාණවත් පොලිස් ආරක්ෂාව යටතේ රැගෙන යායුතුය . තවද, අවසන් ගෞරව දැක්වීම අවශ්‍යතාවය පරිදි උපරිම විනාඩි 30 කට සීමා විය යුතු අතර, කිසිදු හේතුවක් මත රාත්‍රී කාලයේදී රැගෙන යාම නොකල යුතුය .

8. රැඳවියා ආපසු බන්ධනාගාරයට ආරක්ෂණය කළ පසු ඒ සම්බන්ධයෙන් වාර්තාවක් මා වෙත එවිය යුතුය.

බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

එච්.එම්.එන්.සී. ධනසිංහ
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.